# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2498/77 - 2026 ජූලි මස 24 වැනි සිකුරාදා - 2026.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ**

**කින්නියා නගර සභාවේ**

**සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන කින්නියා නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කින්නියා නගර සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ අබ්දුල් රවුෆ් ආරිස් මහතා අයත් වන්නා වූ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ 30 ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කින්නියා නගර සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වරිසයි මොහමඩ් මොහමඩ් රාෆී මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කින්නියා නගර සභාවේ තේරීම්භාර නිලධාරි සෙල්ලදොරේ කලියුගනාදන් දේව නෙරංජන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් වරිසයි මොහමඩ් මොහමඩ් රාෆී මහතා කින්නියා නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**එස්. කේ. දේව නෙරංජන්,**
තේරීම්භාර නිලධාරි,
කින්නියා නගර සභාව.

2026 ජූලි මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය.
ත්‍රිකුණාමලය.

EOG 07 - 0358

1A - PG 7834 — 04 (2026/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*